**නාගරික සංවර්ධන අධිකාරිය 2012**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය - සමූහය**

වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**තත්ත්වාගණනය කළ මතය - අධිකාරිය**

වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන**

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරියේ පරිපාලිත සමාගමක් වූ පෑලියගොඩ වෙයාර්හවුස් සංකීර්ණ සමාගමේ 2012 වර්ෂයට අදාළ විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන තිබුණි.

**1.2.2 ණයකර නිකුතුව**

කොළඹ නගරයේ පැල්පත් වාසින්ට ස්ථිර නිවාස 65,000 ක් ඉදිකිරීමේ ජාතික වැඩපිළිවෙලට අරමුදල් සපයා ගැනීමේ අරමුණින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2010 ඔක්තෝබර් මාසයේදී රු. බිලියන 10 ක අවුරුදු 5 කින් නිදහස් කළ යුතු ණයකර නිකුත් කර තිබුණු අතර පළමු වර්ෂ තුනක කාලය සඳහා ණයකර පොළී මුදල් ප්‍රතිපාදනය කිරීමට මහා භාණ්ඩාගාරය එකඟ වී තිබුණි.

**1.2.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01

එකතුව රු.8,287,857 ක ණයගැති ශේෂ ලියාහැරිමේදි (ප්‍රමිතියට) පටහැනිව එකතුව රු.903,758 ක් ණය හිමි ශේෂ හිලව්කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

I. ප්‍රමිතිය අනුව, අධිකාරියේ කටයුතු සඳහා තවදුරටත් භාවිතයට ගන්නා වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් වල වටිනාකම් හා ප්‍රත්‍යාගණනය කර ඵලදායී ජීවිත කාලය ගිණුම්වල ගැලපිය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් ප්‍රයෝජනයට ගනු ලැබූ පිරිවැය රු.90,369,030 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වාහන 72 ක් සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රමිතිය අනුව කටයුතු කර නොතිබුණි.

II. වර්ෂ 50 ට වඩා වැඩි කාලයක් සඳහා බාහිර පාර්ශවයන් වෙත බදු දී තිබුණු අධිකාරිය සතු ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් ගිණුම් ගත කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 24

සමාලෝචිත වර්ෂයේදී අලාභ හා ලියාහැරීම් ලෙස රු.33,099,872 ක බොල් ණය කපාහැරීමක් සිදුකර තිබුණද ඒ පිළිබඳව ඉහත ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 26

අධිකාරිය විසින් විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මක් (Retirement Benefit Plan) සකස් කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.

### 1.2.4 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරිය විසින් කරගෙන යනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව ප්‍රාග්ධන නොනිමි වැඩ ශේෂය රු. 6,032,758,837 ක් වූ අතර ඊට ඉන්ධන වියදම්, ගමන් වියදම්, අළුත්වැඩියා වියදම් වැනි සංවර්ධන කාර්යයන් සඳහා ඍජුවම අදාළ නොවන පුනරාවර්තන වියදම් ද ඇතුළත් කර තිබීම හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දින ශේෂ පත්‍රයේ පෙන්වා තිබුණු ප්‍රාග්ධන නොනිමි වැඩ ශේෂය අධිගණනය වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) අධිකාරියේ වත්කම් ලෙස සැලකිය නොහැකි බාහිර පාර්ශවයන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ නගර සංවර්ධන ව්‍යාපෘති 10 ක් වෙනුවෙන් දරා තිබුණු රු.52,931,659 ක මුදලක් ප්‍රාග්ධන නොනිමි වැඩ යටතේ දක්වා තිබුණි.

(ඇ) බැංකු ඇපකර වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ජුනි හා නොවැම්බර් මාසවලදී ගෙවා තිබුණු රු.64,305,777 ක කොමිස් මුදල අතුරින් රු.50,967,170 ක මුදලක් ඉදිරි වර්ෂ සඳහා වූ කොන්ත්‍රාත්වලට අදාල වන නමුත් ඒ බව නොසලකා සමාලෝචිත වර්ෂයේදී මුළු කොමිස් මුදලම ප්‍රාග්ධන ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ප්‍රාග්ධන නොනිමි වටිනාකම රු.50,967,170 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික දීමනා වෙනුවෙන් රු.115,921,061 ක් සහ අත්පත් කරගත් ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි හා පොළී මුදල වූ රු.729,646,332 ක් වෙනුවෙන් වෙනම ආයෝජනයන් සිදුකර නොතිබුණි.

(ඉ) අධිකාරිය විසින් අත්පත් කරගෙන තිබුණු එහෙත් පසුකාලීනව( අවසතු) කළ ඉඩම්වල වටිනාකම, ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ගෙවිය යුතු වන්දි මුදල් ලෙස දක්වා ඇති රු.729,646,332 ක නිරවද්‍යතාවය විගණනයේදි තහවුරු නොවීය.

### 1.2.5 අසම්භාව්‍ය බැරකම්

--------------------

සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්ති භාර අරමුදලේ විධිවිධානයන්ට පටහැනිව දායක මුදල් ගණනය කිරීම හේතුවෙන් අනාගතයේදී ගෙවීමට සිදුවිය හැකි අසම්භාව්‍ය බැරකම් පැවතියද ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 1.2.6 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් ශේෂ අදාළ උප ලේඛණ සමඟ යාවත්කාලීනව සසඳා නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් වු ගිණුම් ශේෂ 06 ක් සම්බන්ධයෙන් රු.8,058,925 ක වෙනසක් වු අතර මෙම ශේෂ අතුරින් අත්පත්කරගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි හා පොළී මුදල, අදාල උපලේඛනයේ දැක්වු ශේෂයට වඩා රු.5,417,109 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.2.7 පැහැදිලි නොකල වෙනස්කම්

වර්ෂ ගණනාවක සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති නොනිම් වැඩ ශේෂයෙන් අඩමාන ණය ලෙස රු.13,856,162 ක් වෙන්කර තිබුණ ද එම වටිනාකම ගණනය කල ආකාරය පිළිබඳ විගණනයට අනාවරණය නොකෙරුණි.

### 1.2.8 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරික්‍ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ව්‍යාපෘති 09 කට අදාලව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙතින් ලබාගත් විවිධ සේවාවන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.6,707,089 ක් ගෙවිය යුතුව පැවති අතර ඉන් ඇතැම් ශේෂයන් වර්ෂ 15 කට වැඩි කාලයක සිට නිරවුල් නොකර පවතින බව නිරීක්ෂණය විය.

(ආ) අධිකාරියට අයත් චාමර්ස් ගොඩනැගිලි සංකීර්ණයෙහි පිහිටි ගොඩනැගිල්ලක් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට කුළියට  ලබා දී තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අයවිය යුතු රු.3,031,534 ක් වු කුළිය අයකරගෙන නොතිබුණි.

(ඇ) අධිකාරිය වෙත පරිපාලන කටයුතු පවරා තිබුණු අම්බලන්ගොඩ නගර සභාවට අයත් තානායම පවත්වාගෙන යාමට බාහිර පාර්ශවයකට අවසර ලබාදී තිබුණු අතර එම පාර්ශවයෙන් 1997 සැප්තැම්බර් සිට 2007 දක්වා වර්ෂ 10 ක කාලයකට අදාලව අධිකාරිය වෙත  අයවිය යුතුව පැවති රු.16,139,095 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයේ හිඟව තිබුණි. තවද මෙම තානායම දකුණු පළාත් සභාවේ ඉල්ලීම පරිදි ප්‍රතිසංස්කරණය කර පවත්වාගෙන යාමට එම පළාත් සභාවට අධිකාරිය විසින් ලබාදීමෙන් අනතුරුව එම තානායම් ගොඩනැගිල්ල මුළුමනින්ම කඩා දමා තිබුණි.

(ඇ) එකතුව රු.56,161,902 ක් වූ බාහිර පාර්ශවයන් වෙත පැවති විවිධ තැන්පතු වර්ෂ 3 ට වැඩි කාලයක් තිස්සේ නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) අධිකරණ තීරණයක් මත 2008 දී අධිකාරිය වෙත පවරන ලද වෝටර්ස් ඒජ් හෝටලයේ වටිනාකම ලෙස තක්සේරු කරන ලද රු.406,483,000 ක මුදලක් එම හෝටලය අයිතිව තිබූ සමාගම වෙත ගෙවිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම මුදල ගෙවීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එම හෝටලයේ මෙහෙයුම් වලින් රු. 130,323,032 ක ශුද්ධ ලාභයක් උපයා ගෙන තිබුණි.

(ඊ) කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණු අත්තිකාරම් මුදල් අතරින් එකතුව රු.186,312,726 ක් වූ ශේෂ වර්ෂ තුනකට වැඩි කාලයක් තිස්සේ අයකර නොගෙන පැවතුණි. මෙම කොන්ත්‍රාත් සම්බන්ධ බිල්පත් හෝ භෞතික ප්‍රගතිය පිළිබඳව තොරතුරු නොවීම හේතුවෙන් එම ශේෂ අයකරගැනීමේ හැකියාව පිළිබඳව විගණනයේදී නිශ්චය කිරීමට නොහැකි විය.

(උ) බලංගොඩ නව බස්නැවතුම්පල පිහිටි ඉඩමේ භුක්තිය 2008 වර්ෂයේදී අධිකාරිය විසින් බලංගොඩ නගර සභාවට පවරා දී තිබුණු අතර එම ඉඩම පැවරීමේදී එහි තක්සේරු වටිනාකම වූ රු.40,000,000 ක මුදල බලංගොඩ නගර සභාවෙන් අයකර ගැනීමට හෝ ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම් ගත කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඌ) සේවක විදේශ ගමන් අත්තිකාරම් රු.1,576,216 ක් වූ ශේෂයක්ද, රු.240,379 ක ඉන්ධන අත්තිකාරම් ශේෂයක් ද, රු. 1,523,961 ක සේවක වෙනත් අත්තිකාරම් ශේෂයක්ද කපාහැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණද අධිකාරියට ලැබිය යුතු මෙම ශේෂයන් කපාහැරීමට පෙර එම ශේෂයන් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

කෙසේ වෙතත් ඇතැම් නිලධාරින් මේ වන විට සේවය අවසන් කර තිබීමත්, වසර 10 කට පැරණි ඇතැම් ගණුදෙනුවල මූලික ලියවිලි නොමැතිකමත් ඇතැම් ශේෂයන් ගිණුම්කරණ දෝෂයන් හේතුවෙන් උද්ගත වී තිබීමත් නිසා ඉහත ශේෂයන් කපාහැරීමට තීරණය කළ බව සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

(එ) ලැබිය යුතු කුළී තැන්පතු යටතේ "විවිධ" ලෙස දක්වා තිබූ එකතුව රු. 2,623,531ක් වූ ශේෂ නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.

### 1.2.9 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවිය යුතු උත්සව අත්තිකාරම් ශේෂය තුළ ඇතුළත් රු.537,551 ක් සෘණ ශේෂ ලෙස දක්වා තිබුණි. එම ශේෂ පිළිබඳව වැඩිදුර තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ආ) අධිකාරිය විසින් ඉදිරිපත් කර තිබුණු මුළුමනින්ම ක්ෂය කර අවසන් වාහන සම්බන්ධයෙන් වූ උප ලේඛණයෙහි, එකතු පිරිවැය රු.52,639,788 ක් ලෙස දක්වා තිබූ අගයට අදාළ වාහන අංක සඳහන් කර නොතිබුණි. තවද එම වාහන මේ වන විටත් ප්‍රයෝජනයට ගන්නා බව හෝ අපහරණය කර තිබෙන බව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු අධිකාරිය සතුව නොතිබුණු බවද නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට පෙර අපහරණය කරන ලද වාහනවල එකතු වටිනාකම ලෙස රු.3,136,274 ක් සඳහන් වුවද ඒ සඳහා වූ විස්තරාත්මක උපලේඛණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) අධිකාරියේ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් අතර ජ'නල් සටහන් යෙදීම සම්බන්ධ පාලනය විධිමත් නොවීය. ඒ අනුව වටිනාකම රු.22,476,895 ක් සඳහා වූ අංක 21386 දරණ ජ'නල් සටහන විගණනය කරන අවස්ථාව වන විට විධිමත් පරිදි සහතික කර නොතිබුණු අතර අදාල සටහනේ අගය රු.98,855,289 ක් වශයෙන් ගිණුම්වලට ගෙන තිබුණි.

(ඉ) අවශ්‍ය පරිදි සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් රු.83,774,107,118 ක් හා රු.1,752,471,622 ක් වශයෙන් ප්‍රත්‍යාගණනය කරන ලද අධිකාරියේ ආයෝජන වත්කම් සහ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වූ ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ඒ හේතුවෙන් අධිකාරියට අයත් සියලුම ආයෝජන වත්කම් සහ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සඳහා හඳුනාගෙන තිබුණු බව සහ ඒවා ලේඛන ගත කළ බවට ප්‍රමාණවත් සාක්ෂි ලැබී නොතිබුණි.

(ඊ) අධිකාරිය විසින් විවිධ බාහිර ආයතන 06 ක් වෙත සිදුකර තිබුණු රු.206,759,841 ක් වූ ආයෝජන සහ රාජ්‍ය ආයතන 03 කින් ලැබිය යුතු රු. 149,567,591 ක මුදලක් සඳහා පිළිවෙලින් අදාළ ආයෝජන සහතිකවල මුල් පිටපත් හා ශේෂ සනාථ කිරීම් යනාදිය නොතිබීම හේතුවෙන් එම අගයන්හි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

**1.2.10 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත | |
| (i) 3(1) හා 3(3) වගන්ති | දිවයින පුරා පිහිටි සංවර්ධනය කිරීමට සුදුසු ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත්කර එම එකිනෙක ප්‍රදේශ භෞතික හා ආර්ථික උපයෝගීතාවය සැලසෙන පරිදි සංවර්ධනය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී එලෙස කටයුතු කර නොතිබුණි. |
| (ii) 11(අ) කොටසේ 8(අ)(i) වගන්තිය | ප්‍රදේශ සංවර්ධනය කළ හැකිවන අයුරින් එකිනෙක ප්‍රදේශය සඳහා සංවර්ධන සැලසුම් සකස්කල යුතු වුවද සමාලෝචිත වර්ෂයේදි එලෙස කටයුතු කර නොතිබුණි. |
| (iii) 8(ආ)(i) හා 5 වන වගන්තිය | සංවර්ධන සැලසුම් පිළියෙල කිරීමට අදාල සියලු කරුණු සම්බන්ධයෙන් අධිකාරියට උපදෙස් දීම සඳහා සැලසුම් කිරීමේ කමිටු සමාලෝචිත වර්ෂයේදී පත්කර නොතිබුණි. |
| ( iv) 8(ඉ) වගන්තිය | කෙටුම්පත් සංවර්ධන සැලසුම් අදාල පළාත් පාලන ආයතන වෙත නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කිරීම සඳහා ලබා දී දින 60 ක් ඉක්ම වූ වහාම සිය නිරීක්ෂණද සමඟ අදාල සංවර්ධන සැලසුම් අමාත්‍යවරයා වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත ) පනත | |
| (i) 8 (අ) සිට (උ) දක්වා , සහ 28 (අ) වගන්තිය | අධිකාරිය විසින් 2011 හා 2012 වර්ෂයන් තුළදී කිසිදු සංවර්ධන ප්‍රදේශයක් සඳහා සංවර්ධන සැලසුම් කිසිවක් අනුමත කර ගැසට් නිවේදනයක් මඟින් ප්‍රසිද්ධ කර නොතිබුණි. ඒ අනුව අදාළ කාර්යය පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණු බව නිරීක්ෂණය කෙරේ. |

| | | |
|---|---|---|
| | (ii) 8 (ඒ) වගන්තිය | සංවර්ධන අවසර පත්‍ර හා අනුමත ගොඩනැගිලි සැලසුම් නොමැතිව සිදුකර තිබුණු ඉදිකිරීම් වලට එරෙහිව අදාළ වගන්තිය පරිදි පියවර නොගත් අවස්ථාවන් විය. මේ සම්බන්ධ විගණනයේදි හෝමාගම සහ සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල අනවසර ඉදිකිරීම් 22 ක් පැවති බව නිරීක්ෂණය වුවද ඒ පිළිබඳ පියවර ගෙන නොතිබුණි. |
| | (iii) 8 ඒ (2) වගන්තිය | සංවර්ධන කටයුතු සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයට අනුකූලව කටයුතු කර අධිකාරිය වෙතින් අනුකූලතා සහතිකයක් ලබාගත යුතුව තිබුණද එවැනි සහතික ලබා නොගෙන වැල්ලවත්ත ප්‍රනාන්දු මාවත, නො.32 ස්ථානයේ මහල් 07 කින් යුත් නිවාස සංකීර්ණයක් ඉදිකර කුලියට ලබාදී තිබුණු බවත් නියැදි පරීක්ෂාවකදී අනාවරණය වූ අතර එයට එරෙහිව අදාල වගන්තිය පරිදි නීතිමය පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ 2006 අගෝස්තු 23 දිනැති අංක 1459 දරන ගැසට් පත්‍රය සහ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ගැසට් පත්‍රයේ 6(vii) ඡේදය | ගැසට් පත්‍රයේ දක්වා ඇති පරිදි ගොඩනැගිල්ලේ ඇස්තමේන්තු පිරිවැය අනුව සේවා ගාස්තු අධිකාරියේ තැන්පත් කරගත යුතු වුවත් වැල්ලවත්ත ප්‍රනාන්දු මාවත නො.32 ස්ථානයේ ඉදිකර තිබුණු මහල් 07 කින් යුත් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් සේවා ගාස්තු ලබාගෙන නොතිබුණි. අනුකූලතා සහතිකය නොමැතිව පදිංචිවීම, භාවිතා කිරීම වෙනුවෙන් දිනකට රු.50 බැගින් ගාස්තුවක් අධිකාරිය වෙත අයකළ යුතු වුවද ගොඩනැගිල්ල සම්බන්ධයෙන් එලෙස ගාස්තු අයකර නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 අතිවිශේෂ ගැසට් පත්‍රය සහ අධිකාරියේ | පළාත් පාලන ආයතන විසින් අදාළ විධිවිධාන පරිදි නාගරික සංවර්ධන අධිකාරිය සඳහා වූ බැංකු ගිණුම් විවෘතකර පවත්වාගෙන යා යුතු වුවද ගම්පහ දිස්ත්‍රික් |

| | | |
|---|---|---|
| | 1987 සැප්තැම්බර් 30 දිනැති සැලසුම් චක්‍රලේඛ අංක 8 , 1993 නොවැම්බර් 18 දිනැති සැලසුම් චක්‍රලේඛ අංක 15 සහ 1993 මාර්තු 16 දිනැති සැලසුම් චක්‍රලේඛ අංක 14 | කාර්යාලයට අදාළ පළාත් පාලන ආයතන 15 ක් වෙතින් අධිකාරියේ සේවා ගාස්තු ආදිය තැන්පත් කිරීම සඳහා බැංකු ගිණුම් විවෘත කර ගෙන නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 135 | අධිකාරියේ කාර්ය මණ්ඩලය වෙත මුල්‍ය බලතල පැවරීම 1999 වර්ෂයෙන් පසුව යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදය | |
| | (i) 13 (1) වගන්තිය | නිලධාරියකුගේ විෂමාචාරයක් පිළිබඳ සැකයක් ඇතිවූ විට හෝ එවැනි තොරතුරු ලද වහාම ඒ පිළිබඳ විස්තර එළිදරව් කරගැනීම සඳහා අදාළ වගන්තිය පරිදි මූලික විමර්ශන ආරම්භ කළ යුතු වුවද සිදුකරන ලද නියදි පරික්ෂාවේදි එසේ සිදුකර නොතිබුණු අවස්ථා 13 ක් නිරීක්ෂණය විය. බොහෝ ප්‍රමාද වී මූලික විමර්ෂණ ආරම්භකර තිබුණු තවත් අවස්ථා 13 ක්ද නිරීක්ෂණය විය. |
| | (ii) 22.1.1 වගන්තිය | අධිකාරියේ චූදිත නිලධාරින්ට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කර අදාල වගන්තිය පරිදි එක් වසරක් ඇතුළත විනය පරීක්ෂණය නිමකර විනය නියෝග නිකුත් කිරීමට විනය බලධාරියා පියවර නොගත් අවස්ථා 02ක් නියැදි පරීක්ෂාවේදි අනාවරණය විය. |
| (උ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | (i) 4.2.6 ඡේදය | අධිකාරියේ කාර්තුමය ප්‍රගති වාර්තා අදාළ කාර්තුව නිම වී දින 30ක් ඇතුළත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යවා නොතිබුණි. |
| | (ii) 9.4 ඡේදය | අධිකාරිය විසින් වසර කිහිපයක සිට රජයේ විවිධ ආයතන වෙත නිලධාරින් 14 දෙනෙකු මුදා හැර තිබුණු අතර එම |

| | | |
|---|---|---|
| | | නිලධාරින්ගේ වැටුප වූ රු.548,580 ක මුදල අදාල ආයතන වලින් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. මෙයින් එක් නිලධාරියෙක් 1998 වර්ෂයේ සිට මෙලෙස මුදාහැර තිබුණි. |
| (ඌ) | 2012 පෙබරවාරි 14 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තීරණය | අධිකාරියේ ශේෂ පත්‍රයෙහි ඇතුළත් වූ ලැබිය යුතු ගිණුම් සම්බන්ධ රු.8,287,587 ක හර ශේෂය ලියාහැරීමට ද, ගෙවිය යුතු ගිණුම් සම්බන්ධව රු.9,455,627 ක බැර ශේෂය නැවත ආදායමට ගැනීමට තීරණය කර තිබුණි. හර ශේෂය ලියාහැර තිබුණ ද බැර ශේෂයේ ඇතුළත් වූ රු.400,000 ක් සහ රු.8,151,869 ක් නැවත ආදායමට ගෙන නොතිබුණි. තවද ඉහත අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ද ලබාගෙන නොතිබුණි. |

**1.3 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**-------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1986 මාර්තු 10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අංක 392/9 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ 10 (1) ඡේදය ප්‍රකාරව විවිධ සංවර්ධන කටයුතු සඳහා මූලික සැලසුම් නිරාකරණ සහතික අධිකාරිය විසින් නිකුත් කරනු ලබන අතර ඒ සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ විධිවිධාන පරිදි ඇතුළත් කරනු ලබන කොන්දේසි හා සීමා කිරීම් අවිධිමත් ආකාරයෙන් ක්‍රියාත්මක කර තිබූ අවස්ථා විගණනයේදි හෙළිදරව් විය. ඒ සම්බන්ධ විස්තර පහත දැක්වේ.

(i) ගම්පහ ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත මහල් එකොළහකින් සමන්විත වූ ගොඩනැගිල්ලක් සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, මධ්‍යම පරිසර අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය, නගර සභාව සහ මාර්ග සංවර්ධන අධිකාරිය වැනි විවිධ නියාමන ආයතන වලින් ලබාගත යුතු නිර්දේශයන් ලබා නොගෙන අධිකාරිය විසින් අදාළ සංවර්ධන සැලසුම අනුමත කර තිබුණි.

(ii) තේ, රබර් සහ පොල් වතු කැබලි කිරීමේ පාලන මණ්ඩලය විසින් ගම්පහ ප්‍රදේශයේ ඉඩමක් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් නිකුත්කර තිබුණු සහතිකයේ අඩංගු

කොන්දේසි වලට පටහැනිව පෞද්ගලික ඉඩම් වෙන්දේසිකරුවකු විසින් එකී ඉඩම එක් ඒකකයක් ලෙස නොසලකා අනුබෙදුම් සිදුකර පොල් වගාවෙන් කොටසක්ද ඉවත් කර තිබුණි. කෙසේ වෙතත් එම කොන්දේසි කඩකිරීම නොසලකා අධිකාරිය විසින් මෙම ඉඩම සඳහා මූලික සැලසුම් නිරාකරණ සහතික නිකුත් කර තිබුණි.

(iii) ගම්පහ කදිරාන ප්‍රදේශයේ පිහිටි අක්කර 04 ක පොල් වගාව සහිත ඉඩම, බිම් කට්ටි 37 කට අනුබෙදුම් කිරීමට ප්‍රථම පොල් වගාකිරීමේ මණ්ඩලයෙන් ලබාගත යුතු වූ නිර්දේශ ලබාගෙන නොතිබුනත් අධිකාරිය විසින් මූලික සැලසුම් නිරාකරණ සහතිකය නිකුත් කර තිබුණි.

(iv) කැළණිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශය සඳහා යෝජිත සංවර්ධන සැලැස්ම අනුව ප්‍රාථමික නේවාසික කලාපය තුළ පිහිටා තිබුණු ඉඩමක් අනුමත කරනු ලැබූ කාර්යයට පටහැනිව ලී ආලේපන නිෂ්පාදන කම්හලක් ඉදිකිරීම සඳහා මූලික සැලසුම් නිරාකරණ සහතිකයක් ලබාදී තිබුණි.

(v) මූලික සැලසුම් නිරාකරණ සහතික නිකුත් කිරිමේදී ඒ සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකළ යුතු අතර එලෙස ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු නොකර ගම්පහ කාර්යාලය විසින් අවස්ථා 07 කදී එම සහතික නිකුත් කර තිබුණි.

(vi) හෙයියන්තුඩුව පිහිටි අක්කර 31 රූඩ් 2 පර්චස් 6 ක් වූ ඉඩමක්, කොටස් 04 කට බෙදා අයිතිය පැවරීම සඳහා තේ,රබර් සහ පොල් වතු කැබලි කිරීමේ පාලන මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණි. පසුව එම කොටස් නැවත අනුබෙදුම් කිරීම සඳහා අවිධිමත්ව කටයුතු කර තිබුණි. ඉන් එක් බිම් කොටසක් නේවාසික කටයුතු සඳහා සංවර්ධනය කිරීම සඳහා නිර්දේශ කර නිරාකරන සහතික ලබාදීමට අධිකාරිය කටයුතු කර තිබුණි. තවද මෙම නිරවුල් සහතිකය ලබාදීමට ප්‍රථම අධිකාරිය විසින් අදාළ ස්ථානය ක්ෂේත්‍ර පරීක්ෂාවකට ලක්කර නොතිබුණි.

(vii) අධිකාරිය විසින් ගොඩනැගිලි සඳහා මූලික සැලසුම් නිරාකරණය පිළිබඳ සහතික නිකුත් කිරීමේදි ඒ පිළිබඳ වැඩිදුර පරීක්ෂාවන් සිදුනොකර අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අතාත්වික ඇස්තමේන්තු මත සහතික නිකුත්කර තිබුණි. ඒ අනුව අයකරනු ලබන සේවා ගාස්තු අඩුවෙන් අයකර තිබුණු බව හෙලිදරව් විය. නිදසුන් ලෙස බියගම

ගෝනවල ප්‍රදේශයේ ප්ලාස්ටික් කර්මාන්ත ශාලාවක් ඉදිකිරීමට අදාලව සහ ගම්පහ ගුවන් පාලම පාරේ නිවාස ඒකක 144 කින් සමන්විත මහල් 11 ක නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට අදාළව ගාස්තු අයකිරීම දැක්විය හැක.

(ආ) අධිකාරිය සතු ඉඩම් විවිධ පාර්ශවයන්ට බදු දීමේදී මූලික මුදල සම්පූර්ණයෙන්ම බදුකරුවන්ගෙන් එකවර ලබාගත යුතු වුවද ඇතැම් බදුකරුවන්ට එය වාර්ෂික වාරික වලින් ගෙවීමට අවස්ථා සලසා දී තිබුණි. නාරාහේන්පිට පිහිටි අධිකාරිය සතු රූඩ් 2 පර්චස් 31 ක ඉඩමක් පුද්ගලික රෝහලක් ඉදිකිරීම සඳහා බදු දීමේදී එහි මූලික මුදල වර්ෂ 28ක වාර්ෂික වාරික වලින් ගෙවීමට අවසර දී තිබුණි.

(ඇ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ II වන කොටසේ 16(1) ඉ වගන්තිය අනුව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කළ යුතුව තිබුණු රු.207,331,767 ක් වූ සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු එම ආයතනයට ප්‍රේෂණය නොකර අධිකාරියේ කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ සහ අධිකාරියේ බදු අයකිරීමට පෙර මෙහෙයුම් ප්‍රතිඵලයන් පිළිවෙලින් රු.686,176,790 ක සහ රු.444,910,230 ක ශුද්ධ ලාභයන් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ එම ප්‍රතිඵලයන් පිළිවෙලින් රු.325,426,585 ක් සහ රු.242,576,469 ක් විය. ඒ අනුව සමූහයේ සහ අධිකාරියේද මූල්‍ය ප්‍රතිඵලයන් හි පිළිවෙලින් සියයට 111 ක එනම් රු.360,750,205 ක සහ සියයට 83 ක එනම් රු.202,333,761 ක වර්ධනයවීම කෙරෙහි කාලීන තැන්පතු ආදායම හා පෙර ගෙවුම් ආදායම ඉහළයෑම බෙහෙවින් බලපා තිබුණි.

**2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ අධිකාරියේ වාණිජ ක්‍රියාකාරකම් කිහිපයකට අදාළ සංඛ්‍යාවන් සංසන්දනය කර පහත දැක්වේ.

| **ක්‍රියාකාරකම** | **ක්‍රියාකාරකම තුලින් ඇති වූ ලාභය (රු.000)** | |
|---|---|---|
| | **2012** | **2011** |
| කුලී ආදායම | 743,939 | 498,929 |
| ඉඩම් හා ගොඩනැගිලි අලෙවිය | 5,907 | 17,620 |
| වෝටර්ස් එජ් (දල ලාභය) | 403,281 | 317,919 |
| ලංකා රෙස්ට්හවුස් (දල ලාභය) | 17,960 | 12,886 |

කුලී ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 49 කින් වර්ධනය වී ඇති අතර ඉඩම් හා ගොඩනැගිලි අලෙවි ආදායම සමාලෝචිත වර්ෂයේදී සියයට 66 කින් පිරිහී ඇති අතර පරිපාලිතයන්ගේ දල ලාභයන්හි වර්ධනය ඉහත දත්තයන් අනුව පිළිවෙලින් සියයට 27 ක් හා සියයට 39 ක් බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගම්පහ දිස්ත්‍රික්කයට අයත් පළාත් පාලන ආයතන 16 අතුරින් ආයතන 14 සඳහා සංවර්ධන සැලසුම් සකසා ගැසට් කිරීමට මෙතෙක් පියවර ගෙන නොමැති බව විගණන නියැදි පරීක්ෂාවකදී අනාවරණය විය. අධිකාරිය විසින් මෙම සංවර්ධන සැලසුම් සකස් කිරීමේ කාර්යයන් සඳහා එක් සැලසුම් නිලධාරිණියක පමණක් යොදවා තිබීමෙන් එම කාර්යය සඳහා අධිකාරිය විසින් ප්‍රමාණවත් ප්‍රමුඛතාවයක් ලබාදී නොතිබුණු බව තහවුරුවේ.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබුණු ත්‍රිකුණාමලය, අම්පාර, අනුරාධපුර හා පොළොන්නරුව යන නගර වල අධිකාරියේ කාර්යාල සංකීර්ණ ඉදිකිරීම හා අගුණකොලපැලැස්ස වෙළඳපල ගොඩනැගිලි ඉදිකිරීම යන කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ආරම්භකර නොතිබුණි. මේ සඳහා වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන්කර තිබුණු රුපියල් මිලියන 101.5 ක මුදල උපයෝජනය කර නොතිබුණි.

(ඈ) විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරිම සඳහා හෝමාගම පිටිපන ප්‍රදේශයේ අධිකාරිය සතු ඉඩමක් පැවරීම සඳහා 2010 වර්ෂයේදී තක්සේරු වටිනාකමින් සියයට 50 ක් වු රු.26,000,000 ක අත්තිකාරමක් ලබාගෙන තිබුණි. අධිකාරිය විසින් එම ඉඩම සඳහා නව වින්‍යාස සැලැස්මට අනුව නිවැරදි පිඹුරක් සකසා ලබා දී නොතිබීම හේතුවෙන් එම කාර්යාංශය වෙතින් අයවිය යුතු වු රු. 26,000,000 ක ඉතිරි මුදල අයකරගැනීමට නොහැකි වී තිබුණි. තවද මේ හේතුවෙන් පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම්ද ආරම්භ කළ නොහැකිව තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ මණ්ඩලයකට අවුරුදු 99 ක කාලයක් සඳහා බදු දී තිබුණු කොළඹ 07 පිහිටි ඉඩමක් සඳහා එම ගිවිසුම ප්‍රකාරව සෑම වසර 05 කට වරක්ම ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව අනුව බදුකුළිය සංශෝධනය කළ යුතුව තිබුණද එම කාර්යය යාවත්කාලීනව කර නොතිබුණි. තවද 1994 ජුලි 21 සිට 2009 ජුලි 20 දක්වා එම ඉඩමේ බදු කුළිය වශයෙන් අධිකාරිය වෙත ලැබිය යුතු රු.5,250,000 ක මුදල අයකරගෙන නොතිබුණි.

(ආ) ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය සඳහා බාහිර පාර්ශවයන්ගෙන් ගොඩනැගිල්ලක් කුළී පදනම මත ලබාගෙන තිබුණි. එම කුළී ගොඩනැගිල්ල සඳහා බදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණු බව නිරීක්ෂණය වු අතර ඒ සඳහා අදාල කුළී මුදල් යාවත්කාලිනව නොගෙවු හා විදුලිය බිල්පත් නියමිත දිනට නිරවුල් නොකිරීම නිසා විදුලිය විසන්ධි කිරීම් සිදුවු අවස්ථාවන් නිරීක්ෂණය විය .

(ඇ) අධිකාරිය සතු ඉඩම්, විවිධ බාහිර පාර්ශවයන් වෙත බදු පදනම මත ලබාදී තිබුණු අතර බදු කටයුතු සම්බන්ධ පාලනයෙහි දුර්වලතා හේතුවෙන් කුළී මුදල් අයකර නොගත් අවස්ථා මෙන්ම සන්තකය ආපසු ලබා නොගත් අවස්ථා නිරීක්ෂණය විය. මෙම පාලන දුර්වලතා හේතුවෙන් පහත තත්වයන්ද උද්ගතවී තිබුණි.

(i) අධිකාරිය සතු ඉඩම් වෙනත් පාර්ශවයන්ට බදුදීමේ දී අදාල වාර්ෂික බිම්කුලිය (Ground Rent) වර්ෂ 5 කට වරක් සංශෝධනය කළ යුතු බව එම ගිවිසුම්වල දැක්වීම අධිකාරියේ පිළිවෙත වුවද එලෙස නොකල අවස්ථාවන් විය. ගම්උදාව ප්‍රදර්ශන කටයුතු සඳහා බදු දී තිබුණු කඹුරුපිටියේ ඉඩම හා විදුලිබල මණ්ඩලයට බදු දී තිබුණු හික්කඩුවේ පිහිටි ඉඩම නිදසුන් ලෙස දැක්විය හැක.

(ii) තවද ඉහත පරිදි වර්ෂ 05 කට වරක් බදුකුළී සංශෝධනය කළ යුතු බව ගිවිසුම්වල දක්වා තිබුණු නමුත් එසේ සංශෝධනය කර නොතිබු අවස්ථාවන්ද විය.

(iii) එලෙස බදු පදනම මත ලබාදුන් ඉඩම් වල ගිවිසුම් ගත කාර්යය සඳහා නිශ්චිත කාලයක් තුළ සංවර්ධන කටයුතු ආරම්භ කර නොතිබු අවස්ථා නිරීක්ෂණය වූ අතර එවැනි අවස්ථා වලදී ගත යුතු නීතිමය පියවරයන් අදාළ බදු ගිවිසුම්වල සඳහන් කර නොතිබීම සහ ඒ පිළිබඳව අධිකාරිය පසු විපරම් සිදු නොකිරීම හේතුවෙන් රජය සතු සීමිත සම්පතක් වන ඉඩම් උපරිම ලෙස සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය කෙරේ.

(iv) වර්ෂ 99 ක කාලයක් සඳහා බදු දී තිබුණු කොළඹ 07 බෞද්ධාලෝක මාවත තුන්මුල්ල හංදියේ පිහිටි පර්චස් 19.6 ක ඉඩම සම්බන්ධයෙන් අයකළ යුතු බදු මුදල වන රු.5,250,000 (වැට් හැර) වර්ෂ ගණනාවක් ගතවුවද අයකරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(v) රත්මලාන පිහිටි පර්චස් 220 ක ඉඩමක් පෞද්ගලික අංශයේ ඇහලුම් සමාගමකට 1992 වර්ෂයේදී බදු පදනමට ලබා දී තිබුණු අතර 2012 ඔක්තෝම්බර් 31 දිනට බදු හා දඩ මුදල් රු.33,037,595 ක් හිඟව පැවතුණි.

(vi) කොළඹ 03, ගාළු පාරේ, අංක 234 ප්‍රදේශයේ පිහිටි දේපලක් බාහිර පාර්ශවයන් වෙත වර්ෂ 50 ක කාලයක් සඳහා බදු දී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් බලපාන විධිමත් ලිඛිත බදු ගිවිසුමක් නොවීය. තවද 2002 පෙබරවාරි 20 සිට 2009 ඔක්තෝබර් 05 දින දක්වා අදාළ ආයතනය විසින් මෙම ඉඩම පරිහරණය කිරීම වෙනුවෙන් අයවිය යුතු රු.5,563,750 ක මුදල අයකර ගැනීමට අධිකාරිය අපොහොසත්ව තිබුණි. තවද මෙම බදුකරු නෙරපා දේපලෙහි සන්තකය පවරා ගැනීමට අවස්ථා දෙකකදී අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී තිබුණද සාමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් අධිකාරිය එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්කයන්ට අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් පිළිබඳ පරීක්ෂාවේදී අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් 43 ක් සිදුකොට ඇති බව අනාවරණය වී තිබුණි. අධිකාරිය විසින් ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) ඉඩම් කොටසක් හුවමාරු කිරීම සම්බන්ධයෙන් බලංගොඩ නගර සභාවෙන් අධිකාරිය වෙත අයවිය යුතුව තිබුණු රුපියල් මිලියන 4 ක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත අනුව සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ගණනයේදී මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව, ජීවනාධාර දීමනාව හා වෙනත් සමාන දීමනා ඇතුළු අනෙකුත් දීමනා ද සලකා බැලිය යුතු වුවද එසේ ගණනය නොකිරීම නිසා අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා වූ සමාලෝචිත වර්ෂයේ දායකය රු. 19,823,420 ක් අඩුවෙන් ගෙවා තිබුණි. තවද අධිකාරිය සේවකයින්ගෙන් අයකර අරමුදලට ගෙවිය යුතුව තිබූ රු. 13,215,613 ක මුදලක්ද අරමුදල වෙත යැවීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. එලෙසම සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත අනුව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙහි දායක මුදල් ගෙවීමේදී විවිධ දීමනාවන් අදාළ කර නොගැනීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා රු.3,964,684 ක මුදලක් අරමුදල වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් ආකාර්යක්ෂමතා**

සෙත්සිරිපාය අදියර II පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ල 2012 මැයි 18 දින විවෘත කර තිබුණු අතර එම ගොඩනැගිල්ලේ වර්ග අඩියක් සඳහා අයකළ යුතු මාසික කුළිය රු.260 ක් ලෙස තීරණය කර තිබුණි. කෙසේ වෙතත් බාහිර ආයතන සඳහා කාර්යාල ඉඩ පහසුකම් කඩිනමින් ලබාදීමට කටයුතුකර නොතිබුණි. ඒ අනුව සාමාලෝචිත වර්ෂය අවසානය වන විට මාස 06 කට වැඩි කාලයක් තිස්සේ ගොඩනැගිල්ලේ වර්ග අඩි 254,951 ක ප්‍රමාණයක් හිස්ව පැවති අතර ඒ අනුව රුපියල් මිලියන 464 ක ආදායමක් අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය.

සභාපතිවරයාගේ පැහැදිලි කිරීම් අනුව ගොඩනැගිල්ලේ අභ්‍යන්තර කාර්යාල පරිශ්‍රයන් සකස්කිරීමට කාලය ගතවීමත්, ගොඩනැගිල්ලේ කටයුතු නිම කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලැබීම ප්‍රමාදවීමත් හේතුවෙන් පරිශ්‍රය කුලියට දීම ප්‍රමාද වී තිබුණි.

**3.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

නාගරික සංවර්ධන අධිකාරි පනතේ බලතල පරිදි අදාළ අමාත්‍යවරයාට කළමනාකරණ මණ්ඩල සාමාජිකයන් 4 දෙනෙකු පමණක් පත්කළ හැකිව තිබියදී එම ප්‍රතිපාදන අභිබවා සාමාජිකයන් 5 දෙනෙකු ඒ සඳහා පත්කර තිබුණි.

**3.5 දෘශ්‍ය අක්‍රමිකතා**

සෙත්සිරිපාය පරිශ්‍රයේ පවතින ඩෙංගු බෝවන ස්ථාන නිසිලෙස හඳුනාගෙන අබලි ද්‍රව්‍ය විධිමත් පරිදි බැහැර කිරීමට දින 07 ක කාලසීමාවක් අදාළ බලධාරින් විසින් අධිකාරියට ලබාදී තිබුණු අතර නියමිත පරිපාටි අනුගමනය නොකර නිසි විනිවිද භාවයකින්ද තොරව පෞද්ගලික ආයතනයක් මඟින් විවිධ අවස්ථාවලදී සුන්බුන් ද්‍රව්‍ය ඉවත් කර තිබුණි. එම අවස්ථාවන්හිදී අධිකාරියට අයත් යතුරු පැදි තුනක් ඇතුලු වෙනත් වටිනා ලෝහමය ද්‍රව්‍ය තොගයක්ද සුන්බුන් ලෙස බැහැර කර තිබුණු බව නිරීක්ෂණය විය.

**3.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) අවිස්සාවේල්ල නගර සංවර්ධනය සඳහා 1998 වර්ෂයේදී අත්පත් කරගෙන තිබුණු අක්කර 24 ඉඩමකින් අක්කර 15 ක කොටසක් කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා යොදාගෙන නොතිබුණු අතර ඒ ඉඩම සංවර්ධනය සඳහා වැඩපිළිවෙලක්ද සකසා නොතිබුණි. තවද මෙම ඉඩමේ හිමිකරුවන්ට වන්දි ලෙස රු.20,125,500 ක් සහ 1998 ඔක්තෝබර් 07 දින සිට එම වන්දි මුදල් සඳහා වාර්ෂිකව සියයට 7 බැගින් පොළි මුදල් ගෙවිය යුතු වුවද එම මුදල් ද ගෙවා නොතිබු බව නිරීක්ෂණය විය.

(ආ) අධිකාරිය විසින් බලංගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අක්කර 27.17 ක ඉඩමක් 1988 වර්ෂයේදී අත්පත් කරගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට ඉන් අක්කර 21.17 ක බිම් ප්‍රමාණයක් සංවර්ධනය සඳහා යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.7 ආර්ථික නොවූ ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ .

(අ) අධිකාරිය විසින් පෞද්ගලික සමාගමක කොටස් මිලදී ගැනීම සඳහා රු.92,000,000 ක් ආයෝජනය කර තිබුණු අතර ඒ සඳහා 2005 සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. පසුව එළඹි අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එම සමාගම පොදු සමාගමක් බවට පරිවර්තනය කර අධිකාරිය විසින් ආයෝජන කළ මුදල ආපසු ලබා ගත යුතු බවට තීරණය කර තිබුණු නමුත් අධිකාරිය එලෙස කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් උප සමාගමක් වෙත පවරා දී තිබුණු ඉඩම් වෙනුවෙන් එම සමාගමේ රු.28,950,000 ක් වටිනා සියයට 18 ක වරණීය කොටස් 2005 වර්ෂයේදී අධිකාරිය වෙත නිකුත් කර තිබුණු අතර එම ආයෝජනය සඳහා කිසිදු ප්‍රතිලාභයක් ආරම්භක අවස්ථාවේ සිටම ලැබී නොතිබුණි.

(ඇ) අධිකාරිය විසින් නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථාවේ ආයෝජනය කරන ලද රු.500,000 ක් සහ කොළඹ ඉඩම් සහ සංවර්ධන සමාගමේ ආයොජනය කරන ලද රු.36,309,841 ක් වෙනුවෙන් සාමාලෝචිත වර්ෂය සඳහා කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණි.

(ඈ) අධිකාරියේ පරිපාලිත සමාගමක් වන පැලියගොඩ වෙයාර් හවුස් හි රු.299,999,930 ක ආයෝජනයක් කර තිබුණු අතර පරිපාලිත සමාගම දිගින් දිගටම අලාභ ලැබීම හේතුවෙන් ආයෝජන පිරිවැය ලියාහැරීම සඳහා ප්‍රතිපාදනයක් කර තිබුණි. සමාලෝචිත වර්ෂය ආරම්භ වන විට එම පරිපාලිත සමාගමෙන් ලැබිය යුතුව තිබු රු.250,326,914 ක ණය මුදලක් වෙනුවෙන් මාසිකව (සියයට 6 බැගින්) රු.1,251,634 ක පොළී ආදායමක් ලැබෙමින් පැවතුනි. එසේ තිබියදි සාමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මස ඉහත ණය මුදලින් රුපියල් මිලියන 200 ක් පරිපාලිත සමාගමේ ආයෝජනයක් බවට පරිවර්තනය කර එම ආයෝජනයටද සියයට 100 ක ප්‍රතිපාදනයක් ඉහත පරිදිම සිදුකර තිබුණි. මේ නිසා ණය මුදල රු. මිලියන 200 කින් අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස අධිකාරියට මාසිකව ලැබෙමින් තිබු රුපියල් 1,000,000 ක පොළී ආදායමක් අහිමි වි තිබුණු අතර ඒ අනුව සාමාලෝචිත වර්ෂයේදි පමණක් රු.8,000,000 ක පොළී ආදායමක් අධිකාරියට අහිමි වී තිබුණි.

කෙසේ වෙතත් , ඉහත සමාගමට අයත් ඉඩමක් වරාය අධිකාරිය විසින් වන්දි මුදල් ගෙවා පවරා ගැනීමට සැලසුම්කර තිබු හෙයින් සමාගම ඈවර කිරීමට අධිකාරියේ කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බවත් , සමාගමෙන් අධිකාරියට ලැබිය යුතු රුපියල් මිලියන 200 ක

ණය ශේෂය ප්‍රාග්ධනය ලෙස පරිවර්තනය කරන ලද්දේ ඒ අනුව බවත් සභාපතිවරයා විසින් පැහැදිලි කර තිබුණි.

(ඉ) නාගරික සංවර්ධන අධිකාරිය රෙස්ට් හවුස් සමාගමේ ප්‍රාග්ධන සහ අයහාර වියදම් පියවා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදි ලබා දී තිබූ රු.15,034,046 ක මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම ශේෂය සඳහා කිසිදු ප්‍රතිලාභයක්ද ලැබී නොතිබුණි.

(ඊ) විවිධ කාර්යන් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරිමේදී එකතු කළ අගය මත බදු වටිනාකම මත මිල ගණන් ලබා ගැනීම අධිකාරිය අනුගමනය කරන ප්‍රතිපත්තිය වුවද වාහන අපහරණයට අදාලව මිල ගණන් කැඳවීමේදි එලෙස කටයුතු නොකිරීම හේතුවෙන් අධිකාරියේ අරමුදල් වලින් රු.1,692,650 ක අගය එකතු කළ අගය මත බදු මුදල් ගෙවීමට සිදුව තිබුණි.

(උ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරණ ගැසට් පත්‍රයේ V උපලේඛනයේ 6 II ඡේදය ප්‍රකාරව නේවාසික හෝ වාණිජ කටයුතු සඳහා සම්පුර්ණයෙන් ඉදිකොට ඇති අවිධිමත් ගොඩනැගිලි අදාළ නීතිමය විධිවිධානවලට අනුව නියමානුකුල කළ හැකිනම්,එපරිදි කටයුතු කර වර්ග මීටරයකට පිළිවෙලින් රු500 ක් හා රු.2000 බැගින් වු ගාස්තු අයකළ හැකිය. එසේ වුවද පහත දැක්වෙන අවස්ථාවන් දෙකෙහිද රු. 26,878,000 ක පමණ ගාස්තුවක් එලෙස අධිකාරියට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.8 හඳුනා ගන්නා ලද පාඩු

------------------------

අඩු පහසුකම් සහිත ජනාවාස පුනස්ථාපන ව්‍යාපෘතිය යටතේ පුනස්ථාපන කටයුතු සඳහා පිහිටුවා තිබුණ, තාවකාලික නිවාසවල පදිංචිකරුවන් වෙනුවෙන් සපයන ලද ජලය සහ විදුලිය යනාදිය සඳහා අධිකාරිය විසින් වැයකර තිබු රු. 9,289,467 ක මුදල අධිකාරියේ ආදායමට එරෙහිව ලියා හැර තිබුණි.

### 3.9 ප්‍රමාද වූ ව්‍යාපෘති

----------------

කොළඹ අගනගරය හා තදාසන්න ප්‍රදේශවල පිහිටි අඩු පහසුකම් සහිත ජනාවාස වෙනුවට පහසුකම් සහිත නිවාස 65,000 ක් ලබාදීමේ ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ 2013 නිම වන විටදී නිවාස 20,500 ක් ඉදිකිරිමට සැලසුම්කර තිබුණි. තවද පළමු අදියරේදී එලෙස අඩු පහසුකම් සහිත ජනාවාස ඉවත්කර අක්කර 150 ක පමණ භූමි ප්‍රමාණයක් මුදවා ගැනීමටත් ඉන් අඩක් පමණ දීර්ඝ කාලීන බදු පදනම මත ආයෝජකයන්ට ලබාදී එමගින් රු. බිලියන 25 ක පමණ ආදායමක්

ඉපයීමටත් සැලසුම් කර තිබුණි. පළමු අදියර සඳහා අවශ්‍ය අරමුදල් ලබාගැනීමට 2010 සැප්තැම්බර් මසදී රු. බිලියන 5 ක් වටිනා වර්ෂ පහකින් නිදහස් කළ යුතු ණයකර නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද එම අවස්ථාවේදී ණයකර සඳහා ලද අධි ඉල්ලුම හේතුවෙන් දෙවන අදියර යටතේ ලබාගැනීමට අපේක්ෂා කළ රු. බිලියන 5 ක මුදලක්ද 2010 වර්ෂයේදීම ලබා ගන්නා ලදී.

කෙසේ වෙතත් අරමුදල් රැස්කර වර්ෂ 4 ක් ගතවී තිබුණු නමුත් පළමු අදියර යටතේ නිම කිරීමට අපේක්ෂා කළ නිවාස සංඛ්‍යාව නිම කර නොතිබුණි. ඒ අනුව අපේක්ෂිත පරිදි රු.බිලියන 25 ආදායමක් ලබාගැනීමට අධිකාරිය අපොහොසත්ව තිබුණි. තවද 2015 වර්ෂයේදී රු. බිලියන 10 ක් වූ ණයකර නිදහස් කිරීම සඳහා අරමුදල් සපයා ගැනීමටද අධිකාරියට සිදුවනු ඇත.

**3.10 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ඇරඹීම**

---

භූමියේ අයිතිය පවරා ගැනීමකින් තොරව හොරණ බස්නැවතුම්පල හා එහි කඩකාමර සහ හම්බන්තොට කාර්යාල සංකීර්ණයට අනුබද්ධ නිවාස ඉදිකිරීමේ කටයුතු අධිකාරිය විසින් සිදුකර තිබුණු අතර එම ඇතැම් ඉදිකිරීම් වලින් ආදායම්ද උපයාගෙන තිබුණි.

**3.11 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 30 දරන ඩීඑම්එස්/වැටුප්/පොදු කළමනාකරණ සේවා චක්‍රලේඛයේ පරිදි අධිකාරිය සඳහා බඳවා ගැනීමේ සහ උසස්වීමේ පටිපාටි අනුමත කරගෙන නොතිබුණි. අධිකාරියේ කළමනාකරණ සේවා ගණයේ (1) ශ්‍රේණියේ ඇතුළත් නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 31 සඳහා උසස්වීම් ලබා දීමේදි ඉහත චක්‍රලේඛයේ ඇමුණුම II හි 5 ඡේදයේ උසස් කිරීම් පරිපාටියට අනුකූල නොවන පරිදි කටයුතුකර තිබුණි.

(ආ) තනතුරු සඳහා බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩලයේ විභාග සහතික ආදියේ නිරවද්‍යතාවය නොපමාව සනාථ කර නොගැනීම හේතුවෙන් වසර 10 කට වැඩි කාලයක් ව්‍යාජ සහතික මත ඇතමුන් අධිකාරියේ රැකියාවල නිරත වන අවස්ථා නිරීක්ෂණය විය. උදාහරණ ලෙස 1997 වර්ෂයේදි පිළිගැනීමේ නිලධාරිණියක් ලෙස බඳවාගත් නිලධාරිණිය ඉදිරිපත්කළ අධ්‍යාපන සහතික ව්‍යාජ ඒවා බව විභාග දෙපාර්තමේන්තුවෙන් සනාථ කර ගැනීම 2012 ජුනි 08 දින දක්වා ප්‍රමාද වි තිබුණි.

**3.12 වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී වාහන 22 ක් මාසික කුළී පදනම මත ලබාගෙන ඒ සඳහා රු.5,783,159 ක් කුළී ලෙස ගෙවා තිබුණි. 2004 අගෝස්තු 31 දිනැති රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛ අංක 353/(5) හි විධිවිධාන අනුව ගෙවිය හැකි මාසික කුළිය රු.40,000 ක් වුවද ඉන් වාහන 4 කට එම සීමාව ඉක්මවා රු.57,142 දක්වා වූ මාසික කුළී ගෙවූ අවස්ථා නිරීක්ෂණය විය. තවද අදාළ චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනිව ඉන් වාහන 10 ක් සඳහා අධිකාරිය මඟින් ඉන්ධන සපයා තිබූ අතර වාහන 06 ක් සඳහා අධිකාරියේ රියදුරන් යොදවා තිබුණි.

(ආ) අධිකාරියට අයත් වාහනවලට සිදුවූ අනතුරු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමේදී

i අධිකාරිය විසින් මු.රෙ. 103(1) පරිදි කටයුතු කර නොමැති අවස්ථා නිරීක්ෂණය විය.

ii වර්ෂයේ පළමු මාස 06 තුළ අනතුරුවලට භාජනය වී තිබූ වාහන 05 කට අදාළ අළුත්වැඩියාවන් සාමාලෝචිත වර්ෂය නිම වන විටත් ආරම්භ කර නොතිබූ අතර වාහන අනතුරුවලට අදාළව පොලිස් වාර්තාවන් ලබාගැනීමේ දීර්ඝ ප්‍රමාදයන්ද ඒ ප්‍රමාද කාලය අතරතුර නැවත අනතුරුවලට ලක් වූ අවස්ථාවන්ද නිරීක්ෂණය විය.

iii අළුත්වැඩියා කිරිමේ අසාමාන්‍ය ප්‍රමාදය නිසා රක්‍ෂණ වන්දි අඩුවෙන් ලැබී ඇති අවස්ථාවන්ද රක්‍ෂණ වන්දි මඟින් ආවරණය නොවූ අළුත්වැඩියා වියදම් අදාළ පාර්ශවයන්ගෙන් ප්‍රතිපූර්ණය කර නොගත් අවස්ථාවන් ද විය.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අංක පීඊඩී/12 දරන 2003 ජුනි 02 දින රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6:5:1 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ කෙටුම්පත් මුල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව එම වර්ෂය නිමවී දින 60 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද නව විගණන ප්‍රමිත අනුව සකසන ලද කෙටුම්පත් මුල්‍ය ප්‍රකාශන මාස 16ක් පමණ ප්‍රමාදවී 2014 ජුලි 03 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී 45 දරන රාජ්‍ය ව්‍යපාර චක්‍රලේඛය පරිදි මූල්‍ය ප්‍රකාශනවලට අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් ප්‍රකාශය ඇතුළත් කර නොතිබුණි.

**4.2 මූල්‍ය පාලනයේ දුර්වලතා**

සමාලෝචිත වර්ෂයට අදාළව යෙදූ ජ'නල් සටහන් 61 ක් සම්බන්ධයෙන් දිනය සටහන් නොකිරීම, පිළියෙල කළ හා පරීක්ෂා කළ බවට අත්සන් නොකිරීම, හර/ බැර විස්තර සඳහන් නොකිරීම, සංලක්ෂය නොදැක්වීම, වටිනාකම සඳහන් නොකිරීම සහ අදාල වටිනාකම් පරිගණක පද්ධතියට ඇතුළත් නොකල අවස්ථාවන් පැවතීම හේතුවෙන් අධිකාරියේ මූල්‍ය ගිණුම්කරණ පද්ධතිය සම්බන්ධ පාලනයන් දුර්වලව තිබුණු බව නිරීක්ෂණය විය.

**4.3 සංයුක්ත සැලැස්ම**

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) 2008 – 2012 වර්ෂ සඳහා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) කොළඹ නගර සංවර්ධන සැලැස්ම යටතේ ඉදිකිරීමට යෝජිත නිවාස 65,000 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

**4.4 ක්‍රියාකාරී සැලැස්ම**

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවේ ඉලක්කයන් හා ගැලපෙන පරිදි වාර්ෂික ක්‍රියාකාරි සැලසුම සකස් කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් ත්‍රෛමාසිකව ප්‍රගති වාර්තා පිළියෙල කරන නමුදු එම වාර්තා ක්‍රියාකාරි සැලැස්මේ දත්ත හා සැසඳීමක් සිදු නොකරන බැවින් ක්‍රියාකාරි සැලැස්ම ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්‍ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නොතිබූ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 1,375 ක් වූ එදිරිසිංහ වත්ත නිවාස ව්‍යාපෘතියද සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි.

**4.5 අභ්‍යන්තර විගණනය**

----------------------

පවත්නා ඇතැම් අභ්‍යන්තර පාලන ක්‍රමවේද දුර්වල තත්ත්වයක පවතින බව අභ්‍යන්තර විගණනය විසින් ද නිරීක්ෂණය කර තිබුණද ඒවා සවිබල ගැන්වීමට ප්‍රවේශයක් ආයතනය තුළ නොපවතින බව නිරීක්ෂණය විය. තවද පවත්නා කාර්ය මණ්ඩලය විගණන අභිප්‍රේරණය කිරීම තුළින් ගුණාත්මක සේවයක් ලබාගැනීමටද කටයුතු කර නොතිබුණි. එලෙසම අධිකාරියේ කාර්යභාර්ය පුළුල්වීමට සාපේක්ෂව අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය බලගැන්වීමටද කටයුතු කර නොතිබුණු අතර අභ්‍යන්තර විගණන වාර්තා මඟින් පෙන්වා දී තිබූ අඩුපාඩු පිළිබඳව කළමනාකරණයද ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණු අවස්ථා විය.

**4.6 අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ඇස්තමේන්තුගත කුළී ආදායම, ස්ථාවර වත්කම් විකිණීම, සේවා සැපයීම සඳහා වූ ගාස්තු , පොළී , ලාභාංශ සහ විවිධ ආදායම් අධිකාරියේ සත්‍ය ආදායම් සමඟ සැසඳීමේදී සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

**4.7 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

---------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6:5:3 ඡේදය පරිදි ආයතනය විසින් සිය වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත සභාගත කළ යුතු වුවද 2010 වර්ෂයෙන් පසු වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි.

**4.8 නොවිසඳී ඇති විගණන ඡේද**

------------------------------

පසුගිය වර්ෂයන්හීදි නිරීක්ෂණය කර තිබූ පහත විෂයන් පිළිබඳව මේ වන විටත් අධිකාරිය විසින් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොමැති අතර එම ඇතැම් නිරීක්ෂණයන් රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ද අවධානයට ලක්වී තිබුණි.

(අ) 2002 වර්ෂයේදී රු. මිලියන 16 ක වියදමින් පිටකොටුව සෝන්ඩර්ස් පෙදෙස් පදික වෙළඳුන් සඳහා ඉදිකර තිබුණු විකල්ප අලෙවි මධ්‍යස්ථානය උපයෝජනය කර නොතිබීම.

(ආ) සභාපති,අධ්‍යක්ෂ ජනරාල් හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලවල නිලධාරින්ට ගෙවනු ලබන වැටුපෙන් 1/3 දීමනාව සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබීම.

(ඇ) දඹුල්ල නව නගර සැලැස්මට අදාළව අයවිය යුතු රු.මිලි. 92 ක හිඟ පරිහරණ ගාස්තු අය නොකිරීම.

(ඈ) ගෙවිය යුතුව තිබූ හිඟ සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් දායකයන් නොගෙවීම.

**4.9 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම**

---

පහත නිරීක්ෂණයන් හේතුවෙන් අධිකාරිය විසින් පාරිසරික හා සමාජ වගකීම ඉටුකිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොමැති බව නිරීක්ෂණය කෙරේ.

(අ) ප්‍රජාවට සුවපහසු ලෙස වාසය කිරීමට සුදුසු පරිසරයක් ඇතිවන අයුරින් දිවයින පුරා සමබර සංවර්ධනයක් ඇතිකිරීමට කටයුතු කර නොතිබීම.

කෙසේවෙතත් කොළඹ සහ දිවයිනේ අනෙකුත් දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ව්‍යාපෘති, සමාලෝචිත වර්ෂයේ සිට ආරම්භ කර ඇති බව සභාපතිවරයා විසින් පවසා ඇත.

(ආ) අනවසර ඉදිකිරීම් වැලැක්වීමේ බලධාරි ආයතනය ලෙස අධිකාරිය සිය වගකීම ප්‍රශස්ථ ලෙස ඉටු කර නොතිබීම.

අධිකාරියේ බලතල පළාත් පාලන ආයතනවලටද විමධ්‍යගත කර ඇති බැවින් අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සම්බන්ධයෙන් එම ආයතනවලටද වගකීම් පැවරෙන බව සභාපතිවරයා පවසා ඇත.

(ඇ) ප්‍රධාන කාර්යාල පරිශ්‍රය මනා පවිත්‍රතාවයකින් යුතුව නඩත්තු නොකර ඩෙංගු වැනි වසංගත ව්‍යාප්ත වීමට සුදුසු පරිසරයක් ඇතිකිරීම හේතුවෙන් ප්‍රාදේශීය සෞඛ්‍ය බලධාරින්ගේ ප්‍රශ්න කිරීම්වලට අධිකාරිය ලක්ව තිබීම.

## 5. පද්ධති හා පාලනය

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින්වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමුකල යුතු වේ.

(අ) අයවැය පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) වාහන අපහරණය

(ඈ) ඇප සුරැකුම්

(ඉ) ණයගැති පාලනය

(ඊ) අත්තිකාරම් පියවීම

(උ) ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙනයාම සහ යාවත්කාලීන කිරීම

(ඌ) සංවර්ධන සැලසුම් සකස්කිරීම

(එ) සංවර්ධන කටයුතු සඳහා නිරවුල් සහතික නිකුත් කිරීම

(ඒ) නිමනොවූ පැවරුම් පිළිබඳ නිරීක්ෂණ